සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

8264

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම : .................................................................... විභාග අංකය : ....................................

සැලකිය යුතුයි :
- පළමු කොටසේ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 01 සිට 20 දක්වා ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරුවලින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

(01) පන්ති කාමර නාට්‍යයක දැකිය හැකි නාට්‍යමය ලක්ෂණයක් නොවන්නේ,
(1) අනුකරණය (2) සමාරෝපය
(3) සංවාද භාවිතය (4) සතර අභිනය භාවිතය

(02) කතාවක් තුළින් යම් අදහසක්, පණිවුඩයක්, අර්ථයක් ප්‍රකාශ වීම හඳුන්වන්නේ,
(1) ගැටුම ලෙස ය. (2) සංවාද ලෙස ය.
(3) තේමාව ලෙස ය. (4) අභිනය ලෙස ය.

(03) ඕනෑම රංගයක් ඉදිරිපත් කිරීම සඳහා භාවිතා කරනු ලබන ස්ථානය නාට්‍ය කලාවේ දී හඳුන්වනු ලබන්නේ,
(1) වේදිකාව ය. (2) රංග භූමිය ය.
(3) කමතය. (4) රඟහලය.

(04) නාට්‍ය කලාව අයත් වනුයේ මින් කුමන මාධ්‍යයට ද?
(1) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයට ය. (2) විද්‍යුත් මාධ්‍යයට ය.
(3) ශ්‍රව්‍ය මාධ්‍යයට ය. (4) දෘශ්‍ය මාධ්‍යයට ය.

(05) සොබා දහම තුළ ද්‍රව්‍ය සම්පිණ්ඩනය වී ඇති අකාරය ආභාෂයට ගනිමින්,
(1) පසුතල හා නාට්‍යෝපකරණ ගොනු කිරීමට හැකි ය.
(2) නාට්‍ය සංගීතය සැකසීමට හැකි ය.
(3) චරිත නිරූපණය කළ හැකි ය.
(4) අභිරූපණය කළ හැකි ය.

(06) මිනිසුන්ගේ හා සතුන්ගේ හැසිරීම දෙස බලා රංගනය සිදු කිරීම හඳුන්වනු ලබන්නේ,
(1) නිරූපණය නමිනි. (2) අනුකරණය නමිනි.
(3) අභිරූපණ නමිනි. (4) ක්ෂණික නිරූපණ නමිනි.

(07) අනුෂාංගික කලාවට අයත් නොවන්නේ මින් කුමක් ද?
(1) අංග රචනය (2) රංග වින්‍යාසය
(3) පසුබිම් සංගීතය (4) රංගනය

(08) නාට්‍යයක සමස්ථ ශරීරාංග චලනය කිරීමෙන් අදහස් ප්‍රකාශ කිරීම

(1) ආංගික අභිනයයි.
(2) වාචික අභිනයයි.
(3) ආහාර්ය අභිනයයයි.
(4) සාත්වික අභිනයයි.

(09) කතාන්දරයක් නාට්‍යයක් බවට පත් කිරීමේ දී දැකිය හැකි නාට්‍යමය ලක්ෂණය වන්නේ,

(1) කතන්දරයේ සේ ම මුල, මැද, අග පිළිවෙළින් නාට්‍යයක තිබීම ය.
(2) කතන්දරයේ ඇති සියලු ම චරිත හා සිද්ධි නාට්‍යයේ දක්නට තිබීම ය.
(3) කතන්දරය මෙන් කියවා රස විඳිය හැකි වීම.
(4) කතන්දරයේ මෙන් නාට්‍යයේ ද ගැටුම් අවස්ථා තිබීම ය.

(10) නාට්‍යමය අවස්ථාවක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,

(1) යම් අවස්ථාවක විවිධ චරිතයන්ගෙන් විවිධ ප්‍රතිචාර දක්විය හැකි බව ය.
(2) ප්‍රබල හා අපූර්ව අවස්ථා නාට්‍යෝචිත වීම ය.
(3) ප්‍රේක්ෂකයින් සියලු දෙනා දන්නා අවස්ථාවක් රඟ දැක්වීම ය.
(4) චරිතවලට ගැළපෙන සරල බස් වහරක් යොදා ගැනීම ය.

(11) චරිතයකට රංගනය සාර්ථක වීමට නම් සිදු විය යුත්තේ,

(1) එක් නළුවෙක් එම චරිතය සිදු කිරීම ය.
(2) එකම චරිතයේ ඇති විවිධ ලක්ෂණ නොසලකා හැරීමය.
(3) බාහිර හා අභ්‍යන්තර චරිත ලක්ෂණ පෙන්වා දීම ය.
(4) චරිත රංගනය විශේෂ සූදානමකින් තොරව සිදු කිරීම ය.

(12) පෙර සූදානමකින් තොරව, පිටපතක් භාවිතයෙන් හෝ පුහුණුවකින් තොරව චරිතයක්, සිද්ධියක් හෝ අවස්ථාවක් රඟ දැක්වීම හඳුන්වනුයේ,

(1) ක්ෂණික නිරූපණ නමිනි.
(2) නිරූපණය නමිනි.
(3) අනුකරණය නමිනි.
(4) අභිරූපණය නමිනි.

(13) ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කිරීමේ දී ශිල්පියා තුළ වර්ධනය නොවන ගුණාංගයක් වන්නේ,

(1) තම අත්දැකීම් මෙන් ම කණ්ඩායමේ අන් අයගේ අත්දැකීම් නිර්මාණයට එක් කර ගැනීම ය.
(2) කෙසේ හෝ තම හැකියාවන් නිර්මාණයට එක් කිරීම ය.
(3) කණ්ඩායමක් ලෙස ක්ෂණිකව ගනු ලබන තීරණවලට එකඟ වීම ය.
(4) නිර්මාණශීලී චින්තනය, පරිකල්පන ශක්තිය වර්ධනය වීම ය.

(14) යම් භාණ්ඩයක් ඒ අකාරයෙන් ම නොමැතිව වෙනත් ආකාරයකින් භාවිත කර නිරූපණය කිරීම හඳුන්වනු ලබන්නේ,

(1) රංග වින්‍යාසය ලෙස ය.
(2) රංග භාණ්ඩ ලෙස ය.
(3) පරිකල්පනය ලෙස ය.
(4) රංග අභ්‍යාස ලෙස ය.

(15) ඓතිහාසික කතාවක් නාට්‍යයක් බවට පත් කිරීමේ දී අනිවාර්යයෙන් ම ඒක ගත යුත්තේ,

(1) කතාවේ ඇති නාට්‍යමය ගුණය ය.
(2) කතාවේ ඇති සියලු සිදුවීම් ය.
(3) කතාවේ ඇති චරිතය ය.
(4) කතාවේ ස්ථානය ය.

(16) රජ කෙනෙක් මෙන් ම දක්ෂ වෛද්‍යවරයෙක් වූයේ,

(1) ගැමුණු රජු ය. (2) පරාක්‍රමබාහු රජු ය.

(3) බුද්ධදාස රජු ය. (4) ගජබා රජු ය.

(17) කිරිබත් කෑමෙන් මහලු මවගේ උපහාසයට ලක් වූයේ මෙම රජුගේ ළමා කාලයේ දී ය.

(1) ගැමුණු රජු ය. (2) පරාක්‍රමබාහු රජු ය.

(3) බුද්ධදාස රජු ය. (4) ගජබා රජු ය.

(18) තම පුතු නැති වූ සොවින් හැඬූ මවට පුතා ද හා තවත් පිරිසක් ද බේරා ගත් රජ වූයේ,

(1) ගැමුණු රජු ය. (2) පරාක්‍රමබාහු රජු ය.

(3) බුද්ධදාස රජු ය. (4) ගජබා රජු ය.

(19) කිසියම් නාට්‍යයකදී නළු නිළියන් විසින් විවිධ චරිත නිරූපණය සඳහා යොදා ගන්නා ඇඳුම් පැළඳුම් හඳුන්වනු ලබන්නේ,

(1) රංග භාණ්ඩ නමිනි. (2) රංග භූමි නමිනි.

(3) වේෂ භූෂණ නමිනි. (4) අංග රචනය නමිනි.

(20) රංගනය සාර්ථක කර ගැනීම සඳහා නළු නිළියන් භාවිත කරන වෙනත් භාණ්ඩ හඳුන්වනුයේ,

(1) නාට්‍යෝපකරණ නමිනි. (2) රංග වස්ත්‍ර නමිනි.

(3) රංගාභරණ නමිනි. (4) රංග පසුතල නමිනි.

ලකුණු 2 x 20 = 40

## II කොටස

- උපදෙස් : දෙවන කොටසෙහි පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.

  තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (i) "අමර ගියා දිව්‍ය ලෝකේ" නාට්‍යයේ අධ්‍යක්ෂකවරයාගේ නම කුමක් ද? (ලකුණු 02)

(ii) "අමර ගියා දිව්‍ය ලෝකේ" නාට්‍යයේ චරිත දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) "අමර ගියා දිව්‍ය ලෝකේ" නාට්‍යයේ තේමාව ලියා දක්වන්න. (ලකුණු 02)

(iv) "අමර ගියා දිව්‍ය ලෝකේ" නාට්‍යයේ අමරගේ ඇති හොඳ හෝ නරක ගතිගුණයක් හා ඉන් ජීවිතයට ලබා ගත හැකි ආදර්ශයක් ලියන්න. (ලකුණු 02)

(v) "අමර ගියා දිව්‍ය ලෝකේ" නාට්‍යයේ අමරගේ වැරදි චර්යාවෙන් මුදා ගැනීමට උදව් වන කණ්ඩායම කවු ද? (ලකුණු 02)

(vi) "අමර ගියා දිව්‍ය ලෝකේ" නාට්‍යයේ චරිතවලට පසුබිම් වන ස්ථාන දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

(02) (i) නාට්‍යයක තේමාව යනු කුමක් ද? (ලකුණු 3)

(ii) නාට්‍යයට තේමාවක් ඇතුළත් කිරීමේ වැදගත්කම කුමක් ද? (ලකුණු 3)

(iii) ඔබ දන්නා නාට්‍ය කෘතියක තේමාව විස්තර කරන්න. (ලකුණු 6)

(03) (i) රංග භූමිය යනු කුමක් ද? (ලකුණු 3)

(ii) ඔබ දන්නා රංග භූමි හතරක් දක්වන්න. (ලකුණු 4)

(iii) රංග භූමියේ රංගනයේ යෙදෙන විට නළුවකු සැලකිලිමත් විය යුතු කරුණු දක්වන්න. (ලකුණු 5)

(04) (i) කටහඬ අභ්‍යාස සඳහා යොදා ගන්නා කෘති දෙකක් ලියන්න. (ලකුණු 2)

(ii) ශරීරය උණුසුම් කිරීමට යොදා ගත හැකි රංග අභ්‍යාස හතරක් නම් කරන්න. (ලකුණු 4)

(iii) රංග අභ්‍යාස සිදු කිරීමෙන් නළුවාට සිදුවන වාසි සාකච්ඡා කරන්න. (ලකුණු 6)

(05) (i) නාට්‍ය ගීතයක් ගායනා කිරීමේ දී සැළකිය යුතු කරුණු තුනක් ලියන්න. (ලකුණු 3)

(ii) ඔබ දන්නා නාට්‍ය දෙකක් හා එහි ඇතුළත් නාට්‍ය ගීත දෙකක් නම් කරන්න. (ලකුණු 4)

(iii) ඔබ කැමැති නාට්‍ය ගීතයක මුල් කොටස ලියන්න. (ලකුණු 5)

(06) (i) ඓතිහාසික කතා ඇතුළත් කෘති දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) ඓතිහාසික කතා හා බැදුණු වීර චරිත හතරක් නම් කරන්න. (ලකුණු 4)

(iii) ඔබ දන්නා ඓතිහාසික කතාවක් කෙටියෙන් ලියන්න. (ලකුණු 6)

(07) පහත දැක්වෙන අවස්ථාව පාදක කරගෙන කෙටි නාට්‍යයකට සුදුසු පෙළ රචනයක් ලියන්න. මෙහි දී ඔබට කැමති පරිදි නාට්‍ය අවසානය නිර්මාණය කළ හැකි ය.

සෝමා දේවියගේ සැමියා වූ වළගම්බා රජතුමා ආරක්ෂා කර ගැනීමට රථයෙන් බසින අවස්ථාව....

ඔබ සෝමා දේවිය හෝ වළගම්බා රජතුමා යැයි සිතා එතැන් සිට ......

(i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරීම (ලකුණු 4)

(ii) සංවාද සහ රංග විධාන සහිතව පෙළ රචනා කිරීම (ලකුණු 8)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 07
විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව

## ප්‍රායෝගික පරීක්ෂණය

(01) පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කේවල)
නිර්දිෂ්ට නාට්‍ය පෙළ - අමර ගියා දිව්‍ය ලෝකේ නාට්‍යයේ දෙබසක් කියවීම (ශිෂ්‍යයාගේ අභිමතය පරිදි)

| | | |
|---|---|---|
| 1. | කටහඬ හා නිවැරදි උච්චාරණය | ලකුණු 5 |
| 2. | චරිතයට අනුකූල වීම | ලකුණු 5 |
| 3. | භාවාත්මක නිරූපණය | ලකුණු 5 |
| 4. | ශාරීරික ප්‍රකාශනය | ලකුණු 5 |
| | | ලකුණු 20 |

(02) ක්ෂණික නිරූපණය (කේවල)
ගුරුවරයා විසින් දෙනු ලබන මාතෘකාවකින් තමන් කැමති මාතෘකාවක් තෝරා ගැනීමට ශිෂ්‍යයාට අවස්ථාව සලසා දෙන්න.

| | | |
|---|---|---|
| 1. | නාට්‍යෝචිත අවස්ථා ගොඩනැඟීම | ලකුණු 5 |
| 2. | නිර්මාණාත්මක බව | ලකුණු 5 |
| 3. | අවකාශ භාවිතය | ලකුණු 5 |
| 4. | ශාරීරික ප්‍රකාශනය | ලකුණු 5 |
| | | ලකුණු 20 |

(03) නාට්‍ය ජවනිකාවක් රඟපෑම (සාමූහික)
නිර්දිෂ්ට නාට්‍යයෙහි එක් ජවනිකාවක් රඟපෑමට ශිෂ්‍ය කණ්ඩායම්වලට උපදෙස් ලබා දෙන්න.

| | | |
|---|---|---|
| 1. | චරිත නිරූපණය | ලකුණු 5 |
| 2. | සංවාද නිවැරදිව උච්චාරණය | ලකුණු 5 |
| 3. | අවකාශ භාවිතය | ලකුණු 5 |
| 4. | ශාරීරික ප්‍රකාශනය | ලකුණු 5 |
| | | ලකුණු 20 |

(04) නාට්‍ය ගීතය (කේවල)
ශිෂ්‍යයා විසින් තෝරා ගන්නා ලද නාට්‍ය ගීතය ගායනය කිරීම.

| | | |
|---|---|---|
| 1. | නිවැරදි නාද මාලාවට ගැයීම. | ලකුණු 5 |
| 2. | මනෝ භාවයන් දනවීම | ලකුණු 5 |
| 3. | අවකාශ භාවිතය | ලකුණු 5 |
| 4. | ශාරීරික ප්‍රකාශනය | ලකුණු 5 |
| | | ලකුණු 20 |

(05) කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම.(කේවල)
ශිෂ්‍යයාගේ අභිමතය පරිදි තෝරා ගන්නා ලද (ජනකතා, ගැමි කතා, උපමා කතා, විදේශීය කතා, සුරංගනා කතා) ඉන් එකක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම.

| | | |
|---|---|---|
| 1. | කථාව පිළිබඳ අවබෝධය | ලකුණු 5 |
| 2. | උච්චාරණය හා හඬ පාලනය | ලකුණු 5 |
| 3. | රංග උපක්‍රම හා අවකාශ භාවිතය | ලකුණු 5 |
| 4. | ශාරීරික ප්‍රකාශනය | ලකුණු 5 |
| | | ලකුණු 20 |

මුළු ලකුණු 100යි.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Answer

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 07 | විෂයය / பாடம் / Subject | නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | පිළිතුරු පත්‍රය |
|---|---|---|---|---|---|---|

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 4 | (06) | 2 | (11) | 3 | (16) | 3 |
| (02) | 3 | (07) | 2 | (12) | 1 | (17) | 1 |
| (03) | 2 | (08) | 1 | (13) | 2 | (18) | 4 |
| (04) | 1 | (09) | 4 | (14) | 3 | (19) | 3 |
| (05) | 1 | (10) | 3 | (15) | 1 | (20) | 1 |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

(01) (i) පාලිත ලොකු පෝතාගම (ලකුණු 2)

(ii) අමර, අම්මා, පූසා, බලුරාල, දොස්තර මාමා, සුරංගනාවන්, යහළුවන් (ලකුණු 2)

(iii) වැරදි මතයක පිහිටා කටයුතු කළ අමර, උපක්‍රමශීලීව, නිවැරදි මාවතකට යොමු කිරීම. (ලකුණු 2)

(iv) හැමටම ආදරය දක්වීම, ඉතා ඉක්මණින් රැවටීමට ලක් වීම, අනුන්ට නොරැවටී අවධානයෙන් කටයුතු කිරීම. (ලකුණු 2)

(v) යහළුවන් සහ දොස්තර මාමා (ලකුණු 2)

(vi) අමරගේ නිවස, දිව්‍ය ලෝකය මෙන් සැදූ කාමරය (ලකුණු 2)

(02) (i) තේමාව යනු කථා වස්තුවෙන් ප්‍රකාශ කරන අදහසයි. (ලකුණු 3)

(ii) ප්‍රේක්ෂකයාට ගැඹුරු ජීවිතාවබෝධයක් ලබාදෙයි. (ලකුණු 3)

(iii) තේමාව විස්තර කිරීමට ලකුණු ලබා දෙන්න. (ලකුණු 6)

(03) (i) ඕනෑම රංගනයක් ඉදිරිපත් කිරීම සඳහා භාවිතා වන ස්ථානය (ලකුණු 3)

(ii) කමත, කරලිය, තානායම්පොල, ප්‍රොසීනියම්, කැරකෙන, රවුම්, අර්ධකවාකාර ග්ලෝබ්, එරිනා ආදී (ලකුණු 4)

(iii) රංග භූමියේ බෙදීම් හඳුනා ගැනීම, අවකාශය නිවැරදි ලෙස භාවිතා කිරීම.
සියලුම ප්‍රේක්ෂකයින් ම නැරඹිය හැකි ආකාරයට රංගනයෙහි යෙදීම.
ප්‍රේක්ෂකයාට පිටුපා රංගනයෙහි නොයෙදීම, ප්‍රේක්ෂකයාට ඇසෙන සේ සංවාද භාවිතා කිරීම.
රංග භූමියේ ඇති පසු තළ, ආලෝකය පිළිබඳව සැලකිලිමත් වීම. (ලකුණු 5)

(04) (i) නම් පොත, සකස්කඩ (ලකුණු 2)

(ii) ශරීරාංග චලනය, වේගයෙන් ඇවිදීම, රිද්මයානුකූල ඇවිදීම, රවුමක් තුළ දෙඇස් පියාගෙන ඇවිදීම ආදී වශයෙන් (ලකුණු 4)

(iii) රූපණ කාර්යය පසු කර ගැනීමට, රංගනයට පෙර සූදානමක් ඇති කර ගැනීම, සබකෝලය නැති කර ගැනීමට, නම්‍යශීලී බව ඇති කර ගැනීමට, මතකය තබා ගැනීමට සහ සම්බන්ධතාවය ඇති කර ගැනීමට, එක් අරමුණක පිහිටුවීමට. (ලකුණු 6)